# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 58 දරන
# බලතල පැවරීමේ
# (ප්‍රාදේශීය ලේකම්වරයන්)
# පනත

---

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 නොවැම්බර් මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7 රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 58 දරන බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරයන්) පනත.

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 13 වන දින]

එල්. ඩී.—ඕ. 72/92

**විවිධ නීති යටතේ දිසාපතිවරයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන සහ ඉටු කරනු ලබන බලතල, කර්තව්‍ය සහ කාර්ය ප්‍රාදේශීය ලේකම්වරයන්ට පැවරීම සඳහා; සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.**

1. (1) මේ පනත 1992 අංක 58 දරන බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරයන්) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 2 වන, 8 වන සහ 9 වන වගන්තිවල විධිවිධාන මේ පනත ක්‍රියාත්මක වන දින සිට බලාත්මක විය යුතු ය.

(3) 3 වන, 4 වන, 5 වන, 6 වන සහ 7 වන වගන්තිවල විධිවිධාන (මෙහි මින්මතු "නියමිත දිනය" වශයෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. විවිධ ප්‍රාදේශීය ලේකම්වරයන්ගේ කොට්ඨාස සම්බන්ධයෙන් සහ විවිධ විධිවිධාන සම්බන්ධයෙන් වෙනස් දින නියම කරනු ලැබිය හැකි අතර ඒ අනුව ප්‍රාදේශීය ලේකම්වරයකුගේ කොට්ඨාසයක් සම්බන්ධයෙන් එවැනි යම් විධිවිධානයක "නියමිත දිනය" සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ඒ ප්‍රාදේශීය ලේකම්වරයාගේ කොට්ඨාසයෙහි ඒ විධිවිධානයන් බලාත්මක කරනු ලබන දිනය සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය. තවද, 4 වන වගන්තියේ විධිවිධාන යම් ප්‍රාදේශීය ලේකම්වරයකුගේ කොට්ඨාසයක බලාත්මක කරනු ලබන අවස්ථාවක, ඒ වගන්තියෙහි සඳහන් ලිඛිත නීතිය ඒ වගන්තියෙහි දක්වා ඇති සංශෝධනවලට යටත්ව, ඒ ප්‍රාදේශීය ලේකම්වරයාගේ කොට්ඨාසය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පිහිටුවීම.**

2. අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් එක් එක් පරිපාලන දිස්ත්‍රික්ක සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාවක් පිහිටුවනු ලැබිය හැකිය. ඒ සෑම නියමයකින්ම එසේ පිහිටුවනු ලබන (මෙහි මින් මතු "කොට්ඨාසයක්" යනුවෙන් සඳහන් කරනු ලබන) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම සහ එහි සීමාවන් දැක්විය යුතු ය.

**ප්‍රාදේශීය ලේකම්වරයාට කොට්ඨාසය පැවරීම.**

3. (1) එක් එක් කොට්ඨාසය තම බල ප්‍රදේශය වශයෙන් ප්‍රාදේශීය ලේකම්වරයකුට වෙන්කර දෙනු ලැබිය යුතු ය. තවද ඒ ප්‍රාදේශීය ලේකම්වරයා විසින්, ලිඛිත නීතිය මගින් ඔහුට පවරන ලද හෝ නියම කරන ලද හෝ වෙන්කර දෙන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, ඒ කොට්ඨාසය ඇතුළත ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

(2) ප්‍රාදේශීය ලේකම්වරයකු විසින්, පළාත් සභාවක යම් ප්‍රඥප්තියකින් තමාට පවරන ලද හෝ නියම කරන ලද හෝ දෙන් කර දෙන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් හෝ පළාතක ආණ්ඩුකාරවරයා විසින් තමා වෙත පවරා දෙන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් තම පත්කිරීමේ බලධරයාගේ එකඟත්වය ඇතිව තම කොට්ඨාසය ඇතුළත ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

ලිඛිත නීතිය අර්ථ නිරූපණය කිරීම.

4. (1) (2) වන උපවගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි හැර, වෙනත් යම් ලිඛිත නීතියක හෝ ඒ ලිඛිත නීතිය යටතේ නිකුත් කරන ලද, සාදන ලද, නියම කරන ලද, ලියා අත්සන් කරන ලද හෝ බලය දෙන ලද කවර හෝ දැන්වීමක, අවසර පත්‍රයක, නිවේදනයක, ආකෘතියක හෝ වෙනත් යම් සාධන පත්‍රයක හෝ ලේඛනයක, "දිසාපතිවරයා", "දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා", "පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා", "පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා හෝ උප දිසාපතිවරයා", "දිසාපතිවරයා, යම් අතිරේක දිසාපතිවරයකු, යම් උප දිසාපතිවරයකු හෝ යම් අතිරේක උප දිසාපතිවරයකු", "සෑම පරිපාලන දිස්ත්‍රික්කයකම දිසාපතිවරයා", හෝ "පළාතක දිසාපතිවරයා" යන යෙදුම්වලින් කවර හෝ යෙදුමක් යෙදෙන කවර හෝ තැනකදී ඒ වෙනුවට, "ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) චාරි මාර්ග ආඥාපනතේ II වන කොටසේ "දිසාපතිවරයා" යන යෙදුම යෙදෙන කවර හෝ තැනකදී ඒ වෙනුවට "දිසා ලේකම්" යන යෙදුම් ආදේශ කරනු ලැබිය යුතු ය.

ගිවිසුම් සහ නඩු කටයුතු සම්බන්ධයෙන් ඉතිරි කිරීම.

5. (1) පරිපාලන දිස්ත්‍රික්කයක දිසාපතිවරයකු විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ නියමිත දිනයට පෙරාතුව සාදනු ලැබ, නිකුත් කරනු ලැබ හෝ ලියා අත්සන් කරනු ලැබ ඒ දිනයෙහි බලපවත්නාවූ සෑම ගිවිසුමක්, එකඟවීමක් හෝ වෙනත් සාධන පත්‍රයක් හෝ ලේඛනයක් ඒ ගිවිසුම, එකඟවීම හෝ වෙනත් සාධන පත්‍රය හෝ ලේඛනය අදාළ වන කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ සාදනු ලබන, නිකුත් කරනු ලබන හෝ ලියා අත්සන් කරනු ලබන ලෙස නැතහොත් සාදනු ලැබූ, නිකුත් කරනු ලැබූ හෝ ලියා අත්සන් කරනු ලැබූ ලෙස ඒ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි සලකනු ලැබිය යුතු ය.

(2) දිසාපතිවරයකු විසින් හෝ ඔහුට විරුද්ධව හෝ දිසාපතිවරයකු නියෝජනය කරන්නා වශයෙන් නීතිපතිවරයා විසින් හෝ ඔහුට විරුද්ධව පවරනු ලැබ, නියමිත දිනයට පෙරාතුවම වූ දින යෙහි විනිශ්චයට භාජනව පවත්නා සියලු නඩු හා නඩු කටයුතු නියමිත දින සිට රජය නියෝජනය කරන්නා වශයෙන් නීතිපතිවරයා විසින් හෝ ඔහුට විරුද්ධව පවරන ලද නඩු හා නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා නොකඩවා පවත්වා ගෙන යනු ලැබිය හැකි ය.

(3) දිසාපතිවරයකු විසින් හෝ ඔහුට විරුද්ධව නැතහොත් දිසාපතිවරයකු නියෝජනය කරන්නා වශයෙන් නීතිපතිවරයා විසින් හෝ ඔහුට විරුද්ධව පවරනු ලැබූ යම් නඩුවකදී හෝ නඩු කට යුත්තකදී යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් සටහන් කරනු ලැබ හෝ කරනු ලැබ, නියමිත දිනයට පෙරාතුවම වූ දිනයෙහි සම්පූර්ණයෙන් ඉටු නොකර පවත්නා මුදල් ගෙවීමට අදාළ සියලු තීන්දු ප්‍රකාශ සහ ප්‍රදාන නියමිත දින සිට රජය නියෝජනය කරන්නා වශයෙන් නීතිපතිවරයාගේ වාසියට හෝ ඔහුට විරුද්ධව හෝ සටහන් කරන ලද හෝ කරන ලද තීන්දු ප්‍රකාශ හෝ ප්‍රදාන ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

ලිඛිත නීතිය අර්ථකථනය කිරීම.

6. සැක දුරු කිරීම සඳහා පහත සඳහන් පරිදි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) වෙනත් යම් ලිඛිත නීතියක් මගින් නියමිත දිනයට පෙරාතුවම වූ දිනයෙහි, යම් අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක්, රීතියක්, නියමයක්, නිවේදනයක් හෝ දැන්වීමක් සෑදීමේ හෝ කිරීමේ බලය පරිපාලන දිස්ත්‍රික්කයක දිසාපතිවරයා වෙත පවරනු ලබන අවස්ථාවක, ඒ නීතිය මගින් නියමිත දින සිට ක්‍රියාත්මක වන පරිදි ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ එක් එක් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඒ කොට්ඨාසය සඳහා එවැනි යම් අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක්, රීතියක්, නියමයක්, නිවේදනයක් හෝ දැන්වීමක් සෑදීමේ හෝ කිරීමේ බලය පවරනු ලබන්නේ යයි තේරුම් ගනු ලැබිය යුතුය ;

(ආ) වෙනත් යම් ලිඛිත නීතියක් මගින් නියමිත දිනයට පෙරාතුවම වූ දිනයෙහි, යම් බලපත්‍රයක්, අවසර පත්‍රයක්, ලියාපදිංචි කිරීමේ සහතිකයක් හෝ වෙනත් ලේඛනයක් නිකුත් කිරීමේ බලය පරිපාලන දිස්ත්‍රික්කයක දිසාපතිවරයා වෙත පවරනු ලබන අවස්ථාවක, ඒ නීතිය මගින් නියමිත දින සිට ක්‍රියාත්මක වන පරිදි ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ එක් එක් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඒ කොට්ඨාසය සඳහා එවැනි යම් බලපත්‍රයක්, අවසර පත්‍රයක්, ලියාපදිංචි කිරීමේ සහතිකයක් හෝ වෙනත් ලේඛනයක් නිකුත් කිරීමේ බලය පවරනු ලබන්නේ යයි තේරුම් ගනු ලැබිය යුතු ය ;

(ඇ) නියමිත දිනයට පෙරාතුවම වූ දිනයෙහි යම් ලිඛිත නීතියක් මගින් යම් ගාස්තු හෝ අයකිරීම් තීරණය කිරීමේ බලය පරිපාලන දිස්ත්‍රික්කයක දිසාපතිවරයා වෙත පවරනු ලබන අවස්ථාවක ඒ නීතිය මගින් නියමිත දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ එක් එක් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත, ඒ කොට්ඨාසය සඳහා එවැනි යම් ගාස්තු හෝ අයකිරීම් තීරණය කිරීමේ බලය පවරනු ලබන්නේ යයි තේරුම් ගනු ලැබිය යුතු ය ;

(ඈ) නියමිත දිනයට පෙරාතුවම වූ දිනයෙහි වෙනත් යම් ලිඛිත නීතියක් මගින් පරිපාලන දිස්ත්‍රික්කයක යම් කොටසක යම් කාරණයකට අදාළ යම් දැන්වීමක්, තොරතුරක්, ප්‍රකාශයක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක්, ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයාට භාර දෙනු ලැබිය යුතු බවට, යවනු ලැබිය යුතු බවට හෝ දෙනු ලැබිය යුතු බවට නියම කරනු ලබන අවස්ථාවක, නියමිත දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ ඒ කොටස පිහිටියේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ද ඒ කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඒ දැන්වීම, තොරතුර, ප්‍රකාශය, වාර්තාව හෝ වෙනත් ලේඛනය භාර දෙනු ලැබිය යුතු බවට, යවනු ලැබිය යුතු බවට හෝ දෙනු ලැබිය යුතු බවට ඒ නීතිය මගින් නියම කරනු ලබන්නේ යයි තේරුම් ගනු ලැබිය යුතු ය.

අතුරු ව්‍යවස්ථා ආදිය සම්බන්ධයෙන් ඉතිරි කිරීම.

7. (1) නියමිත දිනයට පෙර වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පරිපාලන දිස්ත්‍රික්කයක දිසාපතිවරයා විසින් සාදන ලද හෝ කරන ලද යම් අතුරු ව්‍යවස්ථාවක, නියෝගයක, රීතියක, නියමයක, නිවේදනයක හෝ දැන්වීමක ක්‍රියාත්මකවීම කෙරෙහි මේ පනත බලපාන්නේ යයි සලකනු නොලැබිය යුතු අතර, ඒ සෑම අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක්, රීතියක්, නියමයක්, නිවේදනයක් හෝ දැන්වීමක් නියමිත දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුරූප ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සාදනු ලැබූ හෝ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) නියමිත දිනයට පෙර පරිපාලන දිස්ත්‍රික්කයක දිසාපතිවරයා විසින් නිකුත් කරන ලද යම් බලපත්‍රයක්, අවසර පත්‍රයක්, ලියාපදිංචි කිරීමක්, සහතිකයක් හෝ වෙනත් ලේඛනයක් නොකඩව බලාත්මකවීම සහ ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක වලංගුභාවය කෙරෙහි මේ පනතින් බලපෑමක් ඇති කෙරෙතැයි සලකනු නොලැබිය යුතු අතර, ඒ සෑම බලපත්‍රයක්, අවසර පත්‍රයක්, ලියාපදිංචි කිරීමක්, සහතිකයක් හෝ වෙනත් ලේඛනයක්, අනුරූප ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබ හෝ ලියා අත්සන් කරනු ලැබ තිබුණු ලෙස නියමිත දින සිට ක්‍රියාත්මක වන පරිදි සලකනු ලැබිය යුතු ය.

(3) පරිපාලන දිස්ත්‍රික්කයක දිසාපතිවරයා විසින් වෙනත් යම් ලිඛිත නීතියකින් ඔහුට පවරන ලද බලය ප්‍රකාර නියමිත දිනයට පෙර යම් ගාස්තු හෝ අයකිරීම් තීරණය කොට ඇති අවස්ථාවක, ඒ තීරණය කෙරෙහි මේ පනතින් බලපෑමක් ඇති නොවිය යුතු ය.

(4) පරිපාලන දිස්ත්‍රික්කයක දිසාපතිවරයා විසින් ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ යම් කොටසක, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ යම් ක්‍රියාවක් හෝ දෙයක් ආරම්භ කොට ඇත්තා වූ ද, නියමිත දිනයට පෙර එය සම්පූර්ණ කොට නැත්තා වූ ද අවස්ථාවක, ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ ඒ කොටස පිහිටියේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ඇතුළත ද ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඒ ක්‍රියාව හෝ දෙය කරගෙන යාම ද සම්පූර්ණ කිරීම ද කළ හැකි ය.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු බව.

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

අර්ථ නිරූපණය.

කොට්ඨාසයක් සම්බන්ධයෙන් වන විට, "ප්‍රාදේශීය ලේකම්වරයා" යන්නෙන්, ආණ්ඩුව විසින් ඒ කොට්ඨාසය සඳහා පත් කරනු ලැබූ ප්‍රාදේශීය ලේකම්වරයා අදහස් වන අතර, ඒ ප්‍රාදේශීය ලේකම්වරයාට පවරන ලද, හෝ නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් සහකාර ප්‍රාදේශීය ලේකම්වරයෙක් ඊට ඇතුළත් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව ලැබෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.